ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 8 කාණ්ඩය 2

2011 දෙසැම්බර්

# තිරසාර හෙට දවසක් සඳහා තේ නැවත වගා කරමු

තේ වගාව වූ කලී, රටේ ආර්ථිකය තුල විශාල මෙහෙවරක් ඉටු කරන භෝගයකි, දළ දේශීය නිෂ්පාදනයට හා සේවා නියුක්තියට තේ කර්මාන්තය මගින් ලැබෙන දායකත්වය ඉතා වැදගත් වේ.

පෙනෙන්නට තිබෙන සංඛ්‍යා දත්ත අනුව සමස්තයක් ලෙස ලංකාවේ තේ වගාව වියපත් වී ඇත. මෙයට ප්‍රධානම හේතුවක් වී ඇත්තේ තිබෙන තේ පඳුරු වයසට යෑම සහ ඒ අනුපාතයට නැවත වගා කිරීම සිදු නොවීමයි. වැවිලි සමාගම් වතු සහ කුඩා තේ ඉඩම් හි වගා කර ඇති රිකිලි තේ වගාවන්ගෙන්ද බොහොමයක් වසර 25 කටත් වඩා පැරණිය. වර්ෂ 1978 සිට පවතින තේ ඉඩම් ප්‍රමාණයෙන් 2% ක් වාර්ෂිකව නැවත වගා කල යුතු බව රජය මගින් තීරණයක් ගෙන තිබුනද පසුගිය කාලය පුරාවටම එය මහ වතු අංශයේනම් 1% ක ප්‍රමාණයකට වත් සිදු වී නොමැත. එම නිසා කල යුත්තේ දිර්ඝ කාලින ව සිතා තේ නැවත වගාවට ආයෝජනය කිරීමයි. නැවත තේ වගා කිරීමේදී සැලකිය යුතු කරුණු කිහිපයක් දෙස වගා කරුවන්ගේ අවධානය යොමු කිරීම මෙම ලිපියේ අරමුණයි.

**ඒ. එල්. රෝහිත යූ. කුමාර**

## 1. සුදුසු භූමියක් තෝරා ගැනීම

තේ නැවත වගා කිරීම සඳහා යෝග්‍ය ඉඩමක් තෝරා ගැනීම ඉතා වැදගත් අංගයක් වේ. තේ යනු වසර ගණනාවක් අස්වනු ලබා ගැනීම සඳහා සිටුවන භෝගයකි. මෙම කාලය පුරා මූල පද්ධතිය හොඳින් වැඩීමට නම් ඒ සඳහා අවශ්‍ය පාංශු ගැඹුර පසෙහි තිබිය යුතුය. මෙහිදී මීටරයකට වඩා ගැඹුර ඇති පසක් තේ වගාව සඳහා නිර්දේශ කෙරේ. පාංශු ගැඹුර ඊට වඩා අඩුවුවහොත් සිදුවන්නේ කෙටි කාලයකදී තද පාෂාන තට්ටුව දක්වා මූල මණ්ඩලය වැඩුණු පසු එහි වර්ධනය අඩාල වීමෙන් නියං කාල වලදී තේ පඳුරු මිය යාමයි. ඉඩමේ මීටරයකට වඩා ගැඹුර වළවල් කැපීම මගින් එම ඉඩමේ පාංශු පැතිකඩ සහ පාංශු ගැඹුර පරීක්ෂා කල හැක.
තවද ඉඩමේ මතු පිට ගල් සහ පර්වත සහිත වීමෙන් හෙක්ටයාරයකට සිටුවිය හැකි තේ පැල ගණන අඩු වේ. එසේම අනිකුත් කෘෂිකාර්මික කටයුතු වලට බාධා පැමිණේ. මතුපිට ගල් සහ පර්වත ප්‍රමාණය 20% අඩු ඉඩම් පමණක් තේ වගාව සඳහා නිර්දේශ කෙරේ.
තේ පැල ඉඩමේ සිටවූ පසු වර්ධනය සඳහා පස සහ මූල මණ්ඩලය අතර සම්බන්ධතාවය ඉතා හොඳින් පැවතිය යුතු අතර පස අධිකව බොරළු සහිත වේ නම් එම සම්බන්ධතාවය දුර්වල වේ. එමෙන්ම, පසේ රැඳෙන ජලය සහ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයද අවම වේ. මෙම තත්වයන් යටතේ නියඟයකදී තේ වගාවට සිදු වන හානිය වැඩිවේ. එබැවින් මතු පිට පසේ බොරළු ප්‍රමාණය 50% කට වැඩි ඉඩම් තේ වගාවට යෝග්‍ය නොවේ.
යම් ඉඩමක් තෝරා ගැනීමේදී එහි යෝග්‍යතාවය තීරණය කරන ප්‍රධාන සාධකයකි ඉඩමේ බෑවුම. අධික බෑවුමක් සහිත ඉඩම් වල පාංශු ඛාදනය වැඩි වශයෙන් සිදු වන අතර තැනි තලා ඉඩම් වල පාංශු ඛාදනය අවම වේ. බෑවුම් සහිත ඉඩම් වල පාංශු සංරක්ෂණ ක්‍රම ඉතා වැදගත්ය. උඩරට හා පහතරට ප්‍රදේශයන්හි තේ වගාව සඳහා නිර්දේශ කරන්නේ බෑවුම 70% වඩා අඩු ඉඩම්ය. නමුත් මැදරට කලාපයේ සෝදා පාළුව අධික බැවින් එහි බෑවුම 55% ට වඩා නොඉක්මවිය යුතුයි.

## 2. පස පුනරුත්ථාපනය

දිර්ඝ කාලයක් තේ පැවති ඉඩමක් නැවත වගා කිරීමේදී පස පුනුරුත්ථාපනය කිරීම නිර්දේශ කරන අතර එමගින් පසෙහි භෞතික, රසායනික මෙන්ම ජෛව ගුණාංග වැඩි දියුණුවේ. ඒ සඳහා තේ පර්යේෂණ ආයතනය මාන හෝ ගෝතමාලා තෘණ වගා කිරීම නිර්දේශ කරන අතර එම තෘණ නිසි කළමණාකරණයකින් යුතුව ඉඩමේ අවම වශයෙන් මාස 18 ක් වත් තිබිය යුතුය. කෙසේ වෙතත් වටපතු අවදානම හේතුවෙන් පහතරට හා මැදරට ප්‍රදේශවලට ගෝතමාලා තෘණ වගාකිරීමෙන් වැලැකීම වඩාත් යෝග්‍ය වේ. මාන තෘණ මගින් පස පුනරුත්තාපනය කිරීමේදී තේ වගාවට හානි කරන වටපණු ගහනය අඩුවන බවද සොයාගෙන ඇත.

## 3. සෙවණ ශාක ස්ථාපනය

පස පුනරුත්තාපනය කරන අවස්ථාවේදීම සෙවණ ශාක ස්ථාපනය කිරීම නිර්දේශ කෙරේ. උස් සෙවණ ශාක සහ මධ්‍යම සෙවණ ශාක නිර්දේශිත පරතර වලින් ස්ථාපනය කිරීම යෝග්‍ය වේ. සෙවණ ශාක මගින් පසට කාබනික ද්‍රව්‍ය එකතු වනවා සේම තේ පැල කුඩා කාලයේදී විශේෂයෙන් වියළි කාල වලදී ඊට යම් සෙවණක් සපයමින් ක්ෂේත්‍රයට අනුවර්තනය වීමට උදව් කරයි. මීට අමතරව තේ ශාකය තුල සිදුවන ප්‍රධාන කායික විද්‍යාත්මක ක්‍රියාවලින් සෙවන ශාක යටතේ ලැබෙන ක්ෂුද්‍ර පරිසරය තුල ප්‍රශස්ත ලෙස සිදුවන බව පර්යේෂණ මගින් සොයා ගෙන ඇත.

## 4. පාංශු සංරක්ෂණ ක්‍රම

බෑවුම වැඩි තේ ඉඩම් වල පස සෝදා පාළුවට ලක්වීම ඵලදායිතාවට ප්‍රබල ගැටළුවක් වී ඇත. එම නිසා මතු පිට පස ආරක්ෂා කිරීම සඳහා පාංශු සංරක්ෂණ ක්‍රම ලෙස ගල් වැටි ඇම්ම කාණු පද්ධතිය සැකසීම සහ දෙවැටි වගා ක්‍රමය හඳුන්වා දිය හැක. මෙහිදී සමෝච්ජ රේඛා පදනම් කරගත් කානු පද්ධතියක් සැකසීම ඉතා යෝග්‍ය වේ. මෙමගින් පස සේදී යෑම අවමවනාවා සේ ම පසේ තෙතමනය රඳා පවත්වා ගැනීමටද වැදගත් වේ. ගල්වැටි ඇම්ම තුළින් ඉවුර කඩා වැටීම වැලැක්වීමට හැකි වේ. එමෙන්ම සැවැන්දරා ශාක ඉවුරු අද්දර සිටු වීමෙන් ඉවුර කඩා යාම වලක්වා එය ආරක්ෂා කරයි. දෙවැටි ක්‍රමය ඉතා වැදගත්ම පාංශු සංරක්ෂණ ක්‍රමයක් වන අතර එමගින් පස සෝදායෑම අඩුවන අතරම දෙවැටි ක්‍රමයට යොදා ගන්නා ලෙගුයුම් ශාක මගින් නයිට්‍රජන් තිර කිරීම සහ කාබනික ද්‍රව්‍ය පසට එකතු වීම සිදුවේ.



## 5. ප්‍රදේශයට නිර්දේශිත ප්‍රභේද සහ ප්‍රමිතියෙන් යුතු පැළ තෝරා ගැනීම

තේ පර්යේෂණ ආයතනය විසින් කෘෂි දේශගුණික තත්වයන්ට අනුව උඩරට, පහතරට, මැදරට සහ ඌව යන ප්‍රදේශ සඳහා තේ ප්‍රභේද නිර්දේශ කර ඇති අතර, නිර්දේශ කිරීමේ දී ඵලදායිතාවය, රෝග හා පලිබෝධ හානි වලට ඔරොත්තු දීමේ හැකියාව සහ නියගයට ඔරොත්තු දීමේ හැකියාව ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගෙන ඇත.
ප්‍රමිතියෙන් යුක්ත සුදුසු පැළ ඔබගේ ක්ෂේත්‍රයේ සිටුවීමෙන් වඩාත් සාර්ථක තේ වගාවක පදනම ඇතිකර ගත හැකිය. ප්‍රමිතියෙන් යුක්ත තේ පැළයක් යන්නෙන් අදහස් කරන්නේ හොඳින් වැඩුණු කොළ 15 - 25 ක් ඇති, අතු 2 - 3 ක් වත් විහිදුණු , අගල් 7 කට වැඩි මූල පද්ධතියක් ඇති හා වයස මාස 8 - 12 ක් අතර වූ තේ පැළය.

ඉහත දැක්වූ කරුණු සැලකිල්ලට ගෙන නැවත තේ වගා කිරීම දිර්ඝකාලින ආර්ථිකමය වාසි ලබා ගැනීම සඳහා වැදගත් වේ. ලංකාවේ තේ වගාව තුළ ඉදිරි දසක දෙක තුළ සිදු විය හැකි අස්වැන්න අඩු වීම වලක්වා ගැනීමට නම් නැවත තේ වගා කිරීම වර්ෂයකට 2% කට වඩා වැඩි වේගයකින් සිදුවිය යුතුය. ඒ සඳහා සියලු වගකිව යුතු පාර්ශවවල අවධානය යොමු කර ක්‍රියාත්මක විය යුතු කාලය එළඹ ඇත.